පන්තිය: 13 | විෂය: රසායන විද්‍යාව | සතිය: අගෝස්තු 15-22

1.ඒකකය : විද්‍යුත් රසායනය

2.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

- අ.පො.ස. උ.පෙළ රසායන විද්‍යා සම්පත් පොත පිටු අංක 233-250 හොඳින් අධ්‍යයනය කරන්න.
- මෙම පාඩමට අදාළව ඊ නැණ පියස , ඊ තාක්ෂලාව වෙබ් සයිට් වලට පිවිස වැඩිදුර හැදෑරීම් කරන්න.
- ඒවායේ ඇතුලත් ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ආධාරක

ඊ නැණ පියස

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=553

ඊ තක්ෂලාව

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=789#section-13

https://youtu.be/QpHFpSxMG-8?list=PLlyv4_Vxwl-z1vfD7icmj0hQs9GY_CXJm

https://youtu.be/HHQwyvQtN9E?list=PLlyv4_Vxwl-z1vfD7icmj0hQs9GY_CXJm

අතිරේක පොත් : රසායන විද්‍යාව සම්පත් පොත (විද්‍යුත් රසායනය)

4.ඉගෙනුම් එල

- ප්‍රබල විද්‍යුත් විච්ඡේද්‍ය, දුබල විද්‍යුත් විච්ඡේද්‍ය හා විද්‍යුත් අවිච්ඡේද්‍ය යන පද සඳහන් කරයි.
- ජලීය මාධ්‍යයේ ප්‍රබල විද්‍යුත් විච්ඡේද්‍ය, දුර්වල විද්‍යුත් විච්ඡේද්‍ය හා විද්‍යුත් අවිච්ඡේද්‍ය සඳහා නිදසුන් සඳහන් කරයි.
- ධාරාව ගෙන යන අංශු සචල අයන හා සචල ඉලෙක්ට්‍රෝන ඇසුරින් විද්‍යුත් සන්නායක හා අයනික සන්නායක සසඳයි.
- විද්‍යුත් විච්ඡේද්‍යයක් හරහා විද්‍යුත් ධාරාවක් ගැලීමට ඉලෙක්ට්‍රෝඩ දෙක ම අසල ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා සිදුවිය යුතු බව ප්‍රකාශ කරයි.
- ප්‍රතිරෝධය හා ප්‍රතිරෝධකතාව යන පද අර්ථ දක්වයි.
- සන්නායකතාව හා සන්නායතාව යන පද අර්ථ දක්වයි.
- විද්‍යුත් විච්ඡේද්‍යයක ද්‍රාවණයක සන්නායකතාව කෙරෙහි බලපාන සාධක සඳහන් කරයි ලෝහ -ලෝහ අයන ඉලෙක්ට්‍රෝඩයක් කටුසටහන් අඳියි.
- නිදසුන් දෙමින්, සුලබ ලෝහ-ලෝහ අයන ඉලෙක්ට්‍රෝඩවල ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා ලියා දක්වයි.
- ඉලෙක්ට්‍රෝඩ / විද්‍යුත් - විච්ඡේද්‍ය අතුරු මුහුණතේ දී ඉලෙක්ට්‍රෝඩය හා එකී ද්‍රාවණය අතර විභව අන්තරයක් ඇතිවන අයුරු විස්තර කරයි.
- විවිධ වර්ගයේ ඉලෙක්ට්‍රෝඩ රූපසටහන් ඇසුරින් විදහා දක්වයි. (වායු ඉලෙක්ට්‍රෝඩ, ලෝහ-ලෝහ අයන ඉලෙක්ට්‍රෝඩ, රෙඩොක්ස් ඉලෙක්ට්‍රෝඩ)
- විවිධ වර්ගයේ ඉලෙක්ට්‍රෝඩ සඳහා ප්‍රතිවර්ත්‍ය ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා ලියයි.
- සම්මත ඉලෙක්ට්‍රෝඩය අර්ථ දක්වයි.
- සම්මත අංකනයෙන් කෝෂ නිරූපණය කරයි